**අපගේ සේවාදායක, විසල් ශාඛා ජාලයක් සතු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක, ශ්‍රී ලංකාවට සෞභාග්‍යය ළඟාකරවීමට උත්සුක වෙමින් සිටින සංවර්ධන බැංකුවකි. ඔවුන්, දේශයේ ආර්ථිකය නගා සිටුවීම සඳහා ධෛර්යය දෙමින් ආදායම් විෂමතා අවම කිරීම්, ග්‍රාමීය ව්‍යවසායකත්වය පෝෂණය කරමින් රැකියා අවස්ථා ජනනය කරයි. දැනට පහත සඳහන් තනතුරු පිරවීම සඳහා ඉහළ කුසලතාවලින් හෙබි වෘත්තිකයන් අවශ්‍යව ඇත.**

# ප්‍රධාන අභ්‍යන්තර විගණක

**MSL යොමු අංකය : 8087**

**ප්‍රධාන අවශ්‍යතා**

- අවම වශයෙන් පහත සඳහන් එක් වෘත්තීමය ආයතනයක සාමාජිකත්වය ලබා තිබිය යුතුය.
  - I. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
  - II. එංගලන්තයේ සහ වේල්සයේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය
  - III. එක්සත් රාජධානියේ සහතිකලත් වරලත් ගණකාධිකාරීන්ගේ සංගමය
  - IV. සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය එක්සත් රාජධානිය / ශ්‍රී ලංකාව හෝ වෙනත් සමාන වෘත්තීය සුදුසුකම්
- ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 08 ක පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, ඉන් වසර 05 ක් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්තව පළපුරුද්ද තිබිය යුතුය.
- තොරතුරු තාක්ෂණය පදනම් කරගත් විගණන ක්‍රමවේද පිළිබඳ මනා දැනුම හා පළපුරුද්ද තිබිය යුතුය.
- පිරිස් කළමනාකරණය සහ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අන්තර් ක්‍රියාකාරිත්වයන් පිළිබඳ තහවුරු කළ හැකි වාර්තා ඉදිරිපත් කළ යුතුය.
- බැංකු ක්ෂේත්‍රයේ ආයතනික යහපාලන භාවිතයන් සහ අනාවරණ අවශ්‍යතා පිළිබඳ දැනුම සහ අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRS) භාවිතය පිළිබඳ දැනුම සහිත වීම.
- වයස අවු. 56 ට වඩා අඩු වීම.

# ප්‍රධාන අවදානම් නිලධාරී

**MSL යොමු අංකය : 8088**

**ප්‍රධාන අවශ්‍යතා**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග පශ්චාත් උපාධි සුදුසුකමක් හෝ බැංකුකරණය පිළිබඳ වෘත්තීමය සුදුසුකමක් ලබා තිබීම.
- ICASL/ ICA (England and Wales)/ ACCA (UK)/CMA(UK)/(SL) යන එක් වෘත්තීමය ආයතනයක සාමාජිකත්වය ලබා තිබීම.
- ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 08ක පළපුරුද්දක්, ඉන් වසර 03ක් බැංකු හා මූල්‍ය ආයතනයක ආවදානම්/ මූල්‍ය/ විගණන ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබිය යුතුය.
- ණය ඇගයීම සහ අනුමත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුම සහ ඇති හැකියාව වාසිදායක වනු ඇත.
- වයස අවු 56ට වඩා අඩු වීම.

---

**සේවා කොන්දේසි**

වසර 03 ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබන වාර්ෂිකව කාර්යසාධනය ඇගයීම සිදුකෙරෙන මෙම තනතුරු, ආයතනික කළමනාකාරිත්ව (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරට සම) තනතුරු වේ.

**වැටුප් පරිමාව**

තෝරාගන්නා ලද අයදුම්කරුවන් සුදුසුකම් සහ පළපුරුද්ද මත සාකච්ඡා කර, ආකර්ෂණීය දීමනාවන් සහිත වැටුපකට හිමිකම් කියනු ඇත.

ඉහත සඳහන් කරන ලද සුදුසුකම් සපුරාලීමට අසමත්වන හෝ වැරදි තොරතුරු ඇතුළත් අයදුම්පත් මෙම බඳවාගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ සහ මෙම බඳවා ගැනීම කල් තැබීම හෝ අවලංගු කිරීමේ අයිතිය සේවාදායක සතුය.

කරුණාකර ඔබගේ සම්පූර්ණ කරන ලද ජීවදත්ත , PDF ආකෘතියෙන් ඥාතිනොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ ඇමතුම් විස්තර සමග මෙම දැන්වීම පළවී දින 10 ක් තුළ **mslrcv@sltnet.lk** වෙත ඉදිරිපත් කළ යුතු අතර, අදාළ විෂය තීරයේ MSL යොමු අංකය සඳහන් කළ යුතුයි.


**MSL Management Systems (Pvt) Ltd.**

**අංක 08, ටිකල් පාර,**
**කොළඹ 08,**
**0112-015900**